Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

දෙවන වාර ඇගයීම
**Mid Year Evaluation - 2018**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 08 | විෂයය / பாடம் / Subject } විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper } I,II | කාලය / காலம் / Time } පැය 02 |

**1 කොටස**

**සැලකිය යුතුයි :**


- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

---

1. තෙත පාන් කැබැල්ලක් මත වැඩී ඇති ක්ෂුද්‍ර ජීවීන් නිරීක්ෂණය කළ ඔබට දැකගත හැකිවූයේ කුමන පැහැයක ක්ෂුද්‍ර ජීවීන් ද?


   i. අළු පැහැතිය  ii. කළු පැහැතිය
   iii. සුදු පැහැතිය  iv. දුඹුරු පැහැතිය

2. මෙම ජීවියා අඩංගු වන කාණ්ඩයේ ලක්ෂණයක් **නොවන්නේ** කුමක්ද?




   i. මෘදු දේහ දරයි.
   ii. පේශිමය පාදයක් ඇත.
   iii. අරීය සමමිතියක් ඇත.
   iv. ශ්ලේෂමලවලින් තෙත් වූ දේහාවරණ ඇත.

3. රූපයේ දක්වා ඇති ජීවියා අයත් වන පෘෂ්ඨවංශී කාණ්ඩය කුමක්ද?



   i. ඇම්ෆිබියා  ii. රෙප්ටීලියා
   iii. ආවේස්  iv. පිස්කේස්

4. පහත දක්වා ඇති ශාකයේ මුල අයත් වන්නේ කුමන මුල් වර්ගයට ද?



   i. කරු මුල්  ii. සංචිත මුල්
   iii. ශ්වසන මුල්  iv. කයිරු මුල්

5. මෙම භාණ්ඩයේ ධ්වනිය උත්පාදනය වන ආකාරය අනුව එය අයත්වන ප්‍රභව කාණ්ඩය කුමක්ද?

   i. පටක කම්පන  ii. වා කඳන් කම්පන
   iii. තන්තු හා දඬු කම්පන  iv. තැටි කම්පන




Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

6. කුඩා හා විශාල කෝප්ප දෙකක් A හා B ලෙස නම් කර සමාන ආතති ඇතිවන පරිදි රබර් පටලයක් සවිකර එක සමාන බලයකින් කම්පනය කරන්න. එවිට

(i) A හි හඬ B හි හඬට වඩා වැඩිය. (ii) B හි හඬ වඩා වැඩිය.

(iii) A හි හඬ සිහින්ය. (iv) A හි හඬ ගොරහැඩිය.

7. පහත දක්වා ඇති සමාන චුම්භක ගුණ සහිත ස්ථිර චුම්භක හතර වෙන වෙනම යකඩ තහඩුවකට ලංකළ විට වඩාත් හොඳින් තහඩුව ආකර්ෂණය වන්නේ කුමන චුම්භකයට ද?




(i) (ii) (iii) (iv)


8. පහත දක්වා ඇති පරිපථයේ ධාරාව ගැලීම සම්බන්ධව, කුමන ප්‍රකාශය සත්‍ය වේ ද? ධාරාව ගලන්නේ,

i. බල්බයේ සිට බැටරිය දෙසටය

ii. බැටරියේ සිට බල්බය දෙසටය

iii. ධන අග්‍රයේ සිට සෘණ අග්‍රය දෙසට ය

iv. සෘණ අග්‍රයේ සිට ධන අග්‍රය දෙසටය




9. අයිස්වල සිදුවන අවස්ථා විපර්යාසය පහත දක්වා ඇත. මෙහි A ලෙස දක්වා ඇත්තේ,

i. විලයනයයි

ii. වාෂ්පීකරණයයි

iii. හිමායනයයි

iv සනීභවනයයි





10. රූපයේ දක්වා ඇති ලෙස ඇටවුම සකස්කර පරීක්ෂණ නළය රත්කර ගිණිකූරු දැල් වූ පසුව නිවෙන්නට ඉඩහැරිය විට,

i. ගිණිකූරු දැල් වූ පසුව එම පරීක්ෂණ නළයේ බර අඩු විය.

ii. ගිණිකූරු දැල් වූ පසුව එහි ස්කන්ධය වැඩිවිය.

iii. ගිණිකූරු දැල් වූ පසුව එහි ස්කන්ධය වෙනස් නොවිය.

iv. මෙහිදී සිදුවන ලද්දේ භෞතික විපර්යාසයකි.




11. ඝන ඉන්ධනයක් වන්නේ මින් කවරක් ද?

i. ඉටි ii. පෙට්‍රල් iii. එල්.පී. ගෑස් iv. ඩීසල්

12. යකඩ මල බැඳීම සඳහා අත්‍යවශ්‍ය සාධක මොනවාද?

A ජලය B ඔක්සිජන් C ලවණ

i. A පමණි. ii. B පමණි. iii. A,B පමණි. iv. B,C පමණි.

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

13. මිරිදිය, කිවුල් දිය, ළිං ජලය හා කරදිය සනත්ව කුප්පියකට පුරවා ස්කන්ධය මැන්න විට වැඩි ස්කන්ධයක් පවතිනුයේ කුමන ජලය පිරවූ විට ද?

i. මිරිදිය ii. කරදිය iii. කිවුල් දිය iv ළිං ජලය

14. හංගුර බව දැකගත හැකි ද්‍රව්‍යය කුමක්ද?

i. ප්ලාස්ටික් ii. වීදුරු iii. රෙදි iv. වියලි හම

15. ලිපිඩ බහුල ආහාර මත ක්ෂුද්‍ර ජීවීන් වැඩීම හඳුන්වන්නේ කුමන නමකින් ද?

i. පැසීම ii. මුඩුවීම iii. පූතිභවනය iv. ඇඹුල් වීම

16. කිරල ඇබයකට චුම්භකනය කළ ඉදිකටුවක අග්‍ර X, Y ලෙස නම් කර ජලයට දැමූ විට ලැබෙන නිරීක්ෂණය වන්නේ කුමක්ද?





i. X,Y උතුර දකුණ දිශාවට හැරේ.
ii. X,Y නැගෙනහිර බස්නාහිර දිශාවට හැරේ.
iii. X,Y ගිනිකොණ වයඹ දිශාවට හැරේ.
iv. X,Y ඊසාන නිරිත දිශාවට හැරේ.

17. වෛරස මගින් වැලදෙන රෝගයක් වන්නේ මින් කවරක් ද?

i. ක්ෂය රෝගය ii. ලීෂ්මානියා
iii. බ්‍රොන්කයිටිස් iv. ඩෙංගු

18. රතු තීන්ත පීරිසියක තබන ලද හුනු කැටයේ නිරීක්ෂණ පදනම් කොට එළඹිය හැකි නිගමනය කුමක් ද?




i. හුණු කැටය රතු වීම
ii. හුණු කැටය තෙත් වීම
iii. සුදු පැහැය අඩුවීම
iv. ඝන පදාර්ථයේ අසංතතික බව

19. වස්තුවක් තත්පර 10 ක දී කම්පන 500 ක් ඇති කරයි නම් එහි සංඛ්‍යාතය කොපමණද?

i. 5 Hz ii. 50 Hz iii. 500 Hz iv. 5000 Hz

20. පහත දක්වා ඇති ද්‍රව්‍ය පරිපථයේ A,B ස්ථානවලට තැබීමෙන් බල්බය වඩාත් දීප්තිමත්ව දැල්වීම සිදුවන්නේ කුමන ද්‍රව්‍ය මගින් ද?




i. තඹ කම්බියක් ii. නික්‍රෝම් කම්බියක්
iii. පැන් විල්ලක් iv. ප්ලාස්ටික් අඩිරූලක්

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

## 11 කොටස

- **1 වන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01.

(A) කාබන් (මිනිරන්) කුරක් සහ යකඩ කුරක් ඔබට සපයා ඇත.


i. මෙම කුරු දෙක වෙන්කර ගන්නා ක්‍රමයක් යෝජනා කරන්න.

.....................................................................................................................

ii. යකඩ හා කාබන් භාවිත කරන අවස්ථාව බැගින් ලියන්න.

- යකඩ - ..........................................................................................
- කාබන් - ..........................................................................................

iii. මෙම කුරු දෙක දී ඇති පරිපථයේ XY නම් අග්‍රවලට සම්බන්ධ කළ විට බල්බයේ දැල්වීම පිළිබඳව දී ඇති වගුව ✓ ලකුණ යොදා සම්පූර්ණ කරන්න.




| | දැල්වේ. | නොදැල්වේ. |
|---|---|---|
| කාබන් කුර | | |
| යකඩ කුර | | |

(B) i. වියළි කෝෂයක විභව අන්තරය කොපමණද?

.....................................................................................................................

ii. විදුලි බල්බයක් දැල්වීමේ දී භාවිතයට නොගෙන අපතේ යන ශක්ති ආකාරය කුමක්ද?

.....................................................................................................................

iii. පරිපථයක බල්බයක් තුළින් යන ධාරාවක් මැනීමට වෝල්ට් මීටරයක් සවිකරන ආකාරය අඳින්න.

.....................................................................................................................

Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(C) i. විද්‍යුත් චුම්භකයක් සෑදීමට ඔබට අවශ්‍ය ද්‍රව්‍යයන් මොනවාද?

..........................................................................................................................................

ii. විද්‍යුත් චුම්භකයක් යොදා ගන්නා අවස්ථාවක් ලියන්න.


..........................................................................................................................................

iii. විද්‍යුත් චුම්භකයක ප්‍රබලතාවය මැන ගන්නේ කෙසේ ද?

..........................................................................................................................................

02.

(A) i. පහත දක්වා ඇති ශාකයේ A සහ B කොටස් නම් කරන්න.




ii. ශාකවල ප්‍රභාසංශ්ලේෂණයට සෘජුවම දායක වන ශාක කොටස කුමක්ද?

iii. ප්‍රභාසංශ්ලේෂණයට අවශ්‍ය ආලෝක ශක්තිය කාර්යක්ෂම ලෙස අවශෝෂණය කිරීමට එම ශාක කොටස් දක්වන අනුවර්තනයක් සඳහන් කරන්න.

iv. මාංශල පත්‍ර දැකගත හැකි වන්නේ කුමන පාරිසරික තත්ත්ව යටතේ වැඩෙන ශාකවල ද?

v. ශාකවලින් ජලය වාෂ්ප ලෙස පිටවීම හඳුන්වන නම කුමක් ද?


(B) i. ජීව වායුව නිපදවීමට ගන්නා අමුද්‍රව්‍ය දෙකක් ලියන්න.

ii. ජීවවායු දහනයෙන් පිටවන වායු වර්ග දෙකක් ලියන්න.

iii. නිර්ජලීය කොපර් සල්ෆේට් මගින් හඳුනාගත හැකි වන්නේ ඉහත සඳහන් කුමන ද්‍රව්‍යය ද?

03. i. ලෝහ මලින වීම යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?

ii. රූපයේ දක්වා ඇති පරීක්ෂණයේ දී A හා B පරීක්ෂණ නළ තුළ ඇති යකඩ ඇණවලට නොලැබෙන, යකඩ මල බැඳීමට අවශ්‍ය සාධකය කුමක්ද?



iii. මෙහි පොල්තෙල් තට්ටුව මගින් කෙරෙන කාර්යය කුමක්ද?

iv. යකඩ මල බැඳුණු විට ලැබෙන වර්ණය කුමක්ද?

v. යකඩ මල බැඳීම වලක්වා ගන්නා ක්‍රම දෙකක් ලියන්න.

vi. පරීක්ෂණ නළයක් තුළ ඇති ජල වාෂ්ප ඉවත් කළ හැකි ක්‍රමයක් ලියන්න.

04. i. ඔබ නිපදවන ලද හඬ උත්පාදක භාණ්ඩයක් සඳහා යොදාගත් ද්‍රව්‍ය ලැයිස්තුවක් ලියන්න.

ii. එහි හඬ උත්පාදනය වන්නේ කෙසේද?

iii. එම භාණ්ඩයෙන් උත්පාදනය වන හඬ අයත් වන්නේ නාද වලට ද ඝෝෂාවකට ද?

iv. සංගීත චිකිත්සාවෙන් ලබාගත හැකි ප්‍රයෝජන දෙකක් ලියන්න.

v. මිනිසාගේ ශ්‍රව්‍යතා සීමාව ලියන්න.

05. (මකුළුවා, හංසයා, සමනලයා, ගොළුබෙල්ලා, නයා, කුඩැල්ලා, පසැගිල්ලා, මුහුදු මල, ගෙම්බා)

i. ඉහත දක්වා ඇති ජීවීන් අතරින් පෘෂ්ඨවංශීන් දෙදෙනෙකු නම් කරන්න.

ii. මකුළුවා අයත් වන කාණ්ඩය කුමක්ද?

iii. ජලයේ පමණක් දැකිය හැකි ජීවියා කවරෙක් ද?

iv. මෘදු දේහයක් දරණ සත්ත්වයා නම් කරන්න.

v. ඔත් ජීවිත ගත කරන ජීවියා කවරෙක් ද?

vi. දේහය සමානව ඛණ්ඩනය වී ඇති ජීවියා කවරෙක් ද?

vii. කොරල සහිත වියළි සමක් ඇති ජීවියා නම් කරන්න.


viii. පෙනහැලිවලට අමතරව සම හා මුඛය මගින් ශ්වසනය කරන ජීවියා කවරෙක්ද?

ix. ඉහත සත්ත්වයින් තුන්දෙනෙකු වෙන් කර ගෙන ඔවුන්ගේ ලක්ෂණ භාවිත කර දෙබෙදුම් සුචියක් ගොඩ නගන්න.

06.

(A) i. මිනිසා විසින් බැහැර කරන බහිස්‍රාවීය ද්‍රව්‍ය දෙකක් ලියන්න.

ii. පහත දක්වා ඇති පද්ධතියේ A, B කොටස් නම් කරන්න.



Sri Lanka's Largest Past Paper Bank – iskolee.com

(B) i. මුත්‍රා ගල් ඇතිවීම කෙරෙහි බලපාන මිනිස් චර්යාවන් දෙකක් ලියන්න.

ii. ශරීරයේ ඇති ඉන්ද්‍රිය හා අවයව අතර මනා සබඳතාවයක් පවත්වා ගැනීම කුමන නමකින් හැඳින්වේ ද?


iii. එම සබඳතාව පවත්වා ගැනීමට දායක වන මොළයේ කොටස කුමක්ද?

iv. මිනිසාගේ සමෙන් කෙරෙන කාර්යයන් දෙකක් ලියන්න.

v. රසායනික පොහොර භාවිතයෙන් ඇතිවේයයි සැලකෙන බහිස්‍රාවී පද්ධතියේ ඇතිවන රෝග තත්වය කුමක්ද?

07. i. විදුලි පන්දම්වල ටංග්ස්ටන් සූත්‍රිකා බල්බ වෙනුවට නූතනයේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා භාවිත උපාංගය කුමක්ද?


ii. රූපයේ දක්වා ඇති යතුරු වර්ග දෙක නම් කරන්න.




iii. විද්‍යුත් ප්‍රතිරෝධයෙන් අධික ලෝහයක් සඳහන් කරන්න.

iv. විද්‍යුත් ප්‍රතිරෝධයක් යෙදීමෙන් පරිපථයක සිදුවන වෙනසක් ලියන්න.

v. ආලෝක සංවේදී ප්‍රතිරෝධකයක් සහිත පරිපථයක් රූපයේ දැක්වේ.



මෙහි ආලෝක සංවේදී පරිපථයට ආලෝකය වැටෙන විට හා අඳුර වැටෙන විට බල්බයේ සිදුවන වෙනස කුමක්ද?

vi. ඉලෙක්ට්‍රොනික උපාංග අධික ලෙස රත්වීම වැළැක්වීම සඳහා යොදා ඇති උපක්‍රමයක් ලියන්න.

vii. බල්බ දෙකක් ශ්‍රේණිගත ලෙස බැටරියකට සවිවන ආකාරය දැක්වෙන පරිපථ සටහනක් අඳින්න.